පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - නර්තනය

දෙවන වාරය- ජූනි මාසය - සතිය - 02

ශ්‍රේණිය - 9

සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා
ර/නිවි/රඹුක ජාතික පාසැල , කලවාන.

# උඩරට නර්තන සම්ප්‍රදාය.

නිපුණතා මට්ටම : නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම : වන්නම් ගයමින් නටමු. (සිංහරාජ වන්නම)

- **මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.**

පළමු පියවර : ඔබට සිංහරාජ වන්නමේ බෙර පදය මාත්‍රා 4න් 4ට තාල තැබීය හැකි දැයි බලන්න.

දෙවන පියවර : එම තාල රූපයටම වන්නමේ තානම හා කවි ගායනා කරන්න උත්සාහ කරන්න.

තුන්වන පියවර : ඔබට මාත්‍රා 4 තාලයට අලංකාර මාත්‍රා තුනක් නිර්මාණය කලහැකිදැයි බලන්න.

හතරවන පියවර : මෙම වන්නමේ තානම කවිය කස්තිරම පාඩම් කරන්න.

## සිංහරාජ වන්නම

තිත :- මාත්‍රා 4 මහ තනිතිත

බෙර පදය :- දොදොංත තකු දොම්

තානම :- තනත් තනෙන තම් - දනත් තනෙන තම්
දනත් තනෙන තම් - දන තා නා තන
තනත් තනෙන තම් - දනත් තනෙන තම්
දනත් තනෙන තම් - දන තා නා

කවිය :- පෙරත් කලෙක සිහ රජෙක් වැටුණු මහ - ළිඳක් තුළෙක ඉබි ලඩෙක් කරපු වැඩ
හැරත් මෙහෙම යස වැඩක් උණේ නැත - චිරත් කලෙක පැවතුමක් යසයි හැඩ

දුරත් බැලුම නොව ළඟත් බලන අය - හටත් එලෙස වෙයි කැටත් තබම් දඩ
වටත් අයට දැනෙනටත් කියම් මම - රටක් වටින සිහ රජ වන්නමෙ හැඩ

කස්තිරම :- තකට තකට තක තරිකිට කුංදත් /// රුංතක ජිංතක ජිංතක ජිංකුඳ ///
තාග්ග ජිංතක තරිකිට කුංදත් // රුංතක ජිංතක තරිකිට කුංදත් තා

සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා

ර/නිවි/රඹුක ජාතික පාසැල , කලවාන.

## පහතරට නර්තන සම්ප්‍රදාය.

නිපුණතා මට්ටම : නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම : වන්නම් ගයමින් නටමු. ( අනුරාගදණ්ඩ තාලය සිංදු වන්නම)

- **මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.**

පළමු පියවර : ඔබට අනුරාගදණ්ඩ තාලය සිංදු වන්නමේ බෙර පදය මාත්‍රා 4න් 4ට තාල තැබීය හැකි දැයි බලන්න.

දෙවන පියවර : එම තාල රූපයටම වන්නමේ තානම හා කවි ගායනා කරන්න උත්සාහ කරන්න.

තුන්වන පියවර : ඔබට මාත්‍රා 4 තාලයට අලංකාර මාත්‍රා තුනක් නිර්මාණය කලහැකිදැයි බලන්න.

හතරවන පියවර : මෙම වන්නමේ තානම කවිය ඉරට්ටිය පාඩම් කරන්න.

### <u>අනුරාගදණ්ඩ තාලය සිංදු වන්නම</u>

තාලය :- මාත්‍රා 4 තනිතිත

බෙරපදය - තක දිත් තක දොං දොං දිං තක දොං

තානම :- තෙන තෙම් තෙන තෙනෙනා - තෙනම් තෙන නා තෙනනම් තෙනෙ නා
තෙන තෙම් තෙන තෙනෙනා - තෙනම් තෙන නා තෙනනම් තෙනෙ නා

කවිය :- තාරඟනා මැදිනා දිසි සුබ්‍රකරා ලෙස සොමි ගුණෙනා
ඒ රාවණ රාවණ නැගි ශුක්‍ර සුරාසුර සමගි වනා
තෝරමිනා කිරණා නිසි අග්‍ර මිණෙවු කිරුළක දරනා
නාරායණා නිතිනා දිසි දීර්ඝ ති ලෝ සත රැක දෙමිනා

ඉරට්ටිය :- තක දිත් තක දොං කිත් තත් කිටිතක
තරිගත දිකුදං දොමිත දොමිත ගත
තකුතත් ගුහිති ගදිරිකිට තා

සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා
ර/නිවි/රඹුක ජාතික පාසැල , කලවාන.

## සබරගමු නර්තන සම්ප්‍රදාය.

නිපුණතා මට්ටම : නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම : වන්නම් ගයමින් නටමු. ( විරාඩි වන්නම)

- **මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.**

පළමු පියවර : ඔබට විරාඩි වන්නමේ බෙර පදය මාත්‍රා 4න් 4ට තාල තැබිය හැකි දැයි බලන්න.

දෙවන පියවර : එම තාල රූපයටම වන්නමේ තානම හා කවි ගායනා කරන්න උත්සාහ කරන්න.

තුන්වන පියවර : ඔබට මාත්‍රා 4 තාලයට අලංකාර මාත්‍රා තුනක් නිර්මාණය කලහැකිදැයි බලන්න.

හතරවන පියවර : මෙම වන්නමේ තානම කවිය කලාසම පාඩම් කරන්න.

### විරාඩි වන්නම

මාත්‍රා 4 තාලය (මහ තනි තිත)
දවුල් පදය - ජිමිත කුදා දොම්
තානම :- තානා තනතම් තන තන තනතම් තන තානා...
තීනා තිනතිම් තින තින තිනතිම් තීන තීනා...

කවිය :- පානා යසසින් සිරිපිරි කුලුණෙන් හිඳ වාරාඩි
බූනා රජ සිත් එක ලෙස නිරතුරු වී වාඩි
ගානා හිමි සිත් පිනවන යසසින් නෙක වාරාඩි
සේනා මැදසිත් කී මේ වන්නම දනු වීරාඩි

කලාසම :- කුදිත ගතිත කුද ගතිගත කුදගත
කුදිත ගතිත කුද ගතිගත කුදගත
කුදිත ගතිත කුද ගතිත කුදිත්තත්